**ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය**

## වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

## ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

# පුරප්පාඩු

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය යටතේ පවතින මාළිගාතැන්න එව්ජින් නෝනා වැඩිහිටි නිවාසයෙහි දැනට පුරප්පාඩුව පවතින පවිත්‍රතා කම්කරු (පිරිමි) – තනතුරු 01 හා උපස්ථායක (පිරිමි) – තනතුරු 01 ක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවාගැනීම සඳහා සුදුසුකම් හා පළපුරුද්ද ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| **තනතුරු නාමය** | **පවිත්‍රතා කම්කරු - තනතුරු 01** |
|---|---|
| **පත්වීමේ ස්වභාවය** | වසර 01 ක කොන්ත්‍රාත් කාලයක් සඳහා පත්කරනු ලැබේ. |
| **මාසික වැටුප** | රු. 40,500/- + ජීවන වියදම් දීමනාව |
| **වයස් සීමාව** | අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. |
| **අධ්‍යාපන සුදුසුකම්** | • අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීම.<br>• තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ. |

| **තනතුරු නාමය** | **උපස්ථායක - තනතුරු 01** |
|---|---|
| **පත්වීමේ ස්වභාවය** | වසර 01 ක කොන්ත්‍රාත් කාලයක් සඳහා පත්කරනු ලැබේ. |
| **මාසික වැටුප** | රු. 40,500/- + ජීවන වියදම් දීමනාව |
| **වයස් සීමාව** | අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. |
| **අධ්‍යාපන සුදුසුකම්** | • අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීම.<br>• රජයේ රෝහලක, බෙහෙත් ශාලාවක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ හෝ පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තු යටතේ ලියාපදිංචි පෞද්ගලික රෝහලක උපස්ථාන කටයුතු සම්බන්ධව වසරක පුහුණුවක් ලබා තිබීම. (සහතික මගින් සනාථ කළ යුතුය)<br>• තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ. |

**සේවා නියුක්ත කරවීමේ කොන්දේසි**

- තනතුරට අදාළ පත්කිරීම කොන්ත්‍රාත් පදනම මත වන අතර, එක් වසරක කොන්ත්‍රාත් කාලයකට යටත් වේ. තනතුරෙහි අවශ්‍යතාවය හා සතුටුදායක කාර්ය සාධනය මත වාර්ෂික කොන්ත්‍රාත් පදනම මත සේවය දීර්ඝ කිරීමේ හැකියාව ඇත.
- රජයේ අනුමත ප්‍රතිපත්ති අනුව සේවක අර්ථසාධක අරමුදලට හා සේවා දායකයින්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිත වේ.
- 2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ සහ 2011 අංක 05 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ (සංශෝධිත) පනතේ විධි විධාන වලටත්, රජය විසින් වරින් වර පනවනු ලබන නීති රීති රෙගුලාසි වලටත් යටත් විය යුතුය.
- මෙම බඳවාගැනීම් සිදුකරනුයේ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය යටතේ පවතින මාළිගාතැන්න එව්ජින් නෝනා වැඩිහිටි නිවාසය සඳහා පමණි.

**වෙනත් පොදු කරුණු**

සෑම ඉල්ලුම්කරුවෙක්ම,

- ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතුය.
- තනතුරකට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
- විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

**තනතුරු සඳහා බඳවාගැනීමේ ක්‍රමය**

- අයදුම්පත් කැඳවීමෙන් පසු පත්කිරීම් බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් තෝරා ගැනීමෙන් පසු බඳවාගනු ලැබේ.

  ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදෙන ආකාරය

| | | |
|---|---|---|
| අදාළ පළපුරුද්ද | - | ලකුණු 20 |
| අදාළ අතිරේක අධ්‍යාපනික සුදුසුකම් / කාර්මික කුසලතා | - | ලකුණු 20 |
| සම්මුඛ පරීක්ෂණයේදී පෙන්වන ලද කාර්ය සාධනය | - | ලකුණු 60 |
| මුළු ලකුණු ගණන | - | ලකුණු 100 |

**අයදුම්පත් යොමු කිරීම**

රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංවිධානයන්හි සේවයේ නියුතු ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත්‍රයක් අදාළ ආයතන ප්‍රධානීන් හරහා ද, බාහිර අයදුම්කරුවන් සෘජුවම ද **2025.07.08** දින හෝ එදිනට පෙර අධ්‍යක්ෂ, ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය, දෙවන මහළ, ඕ කොටස, සෙත්සිරිපාය දෙවන අදියර, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි ඔබ ඉල්ලුම්කරන තනතුර සටහන් කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත්, ආදර්ශ අයදුම්පත අනුව සකස් නොකළ අයදුම්පත්, හා අසම්පූර්ණ, අපැහැදිළි, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**කේ. චතුර මිහිඳුම්**
**අධ්‍යක්ෂ,**
**ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය**
**දෙවන මහළ, ඕ කොටස,**
**සෙත්සිරිපාය දෙවන අදියර,**
**බත්තරමුල්ල**
**2025.06.**